**ආයතනයේ නම**

ජාතික ලොතරැයි මණ්ඩලය

**නෛතික තත්ත්වය**

ආරෝග්‍යශාලා ලොතරැයි අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී. 1997 වසරේදී ඉහත පනත යටතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත පනත) යටතේ සංශෝධනය කර ඇත.

**පිහිටුවන ලද වර්ෂය**

1963

**ගිණුම් වර්ෂය අවසන් වනුයේ**

දෙසැම්බර් 31

**ලියාපදිංචි කාර්යාලය**

**ලිපිනය:** අංක 234/2,
ගාලුපාර,
කොළඹ 03.

**දුරකථන :** 2470662, 2470663, 4607000, 4716990 – 2

**ෆැක්ස් :** 2421897, 2326528, 2433631, 2470661

**විද්‍යුත් තැපෑල**: nlbgen@sltnet.lk

**වෙබ් අඩවිය:** www.nlb.lk

**විගණක**

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**බැංකුකරු**

මහජන බැංකුව

2011 දෙසැම්බර් 31 දිනෙන්

අවසන් වන

48 වන වසර සඳහා

"නිහතමානි ආරම්භයේ සිට දැවැන්ත ජයග්‍රහණයක් කරා වූ 48 වසරක ගමන් මගේදී සියළුදෙනාම ජයග්‍රාහකයින් කිරීමට අපට හැකිවිය."

"සියළුදෙනාම ජයග්‍රාහකයින්"

පටුන

## දළ විශ්ලේෂණය


දර්ශනය, මෙහෙවර, සංවිධාන පරමාර්ථ හා අරමුණු 05

ආරම්භය සහ ප්‍රධාන සිදුවීම් 07

සංස්ථාමය තොරතුරු 10


## විධායක වාර්තා


සභාපතිගේ සමාලෝචනය 14

ක්‍රියාකාරි අධ්‍යක්ෂකගේ වාර්තාව 18

විගණන හා කළමණාකරන කමිටු වාර්තාව 22


## මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු


ආදායම් සටහන 24

ශේෂ පත්‍රය 25

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 26

ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් ප්‍රකාශය 27

ගිණුම් සඳහා සටහන් 28

විශේෂ ගිණුම්කරන ප්‍රතිපත්තීන් 32


## මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය


ග්‍රාපිත සමාලෝචනය 37

නිෂ්පාදන විෂය ධාරාව 38

පසුගිය දශකයේ සාරාංශය 46

සාමුහික සමාජීය වගකීම් 48


## විගණකාධිපති වාර්තාව


විගණකාධිපතිගේ වාර්තාව 51

## සංවිධාන පරමාර්ථ

- රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ඉපයීම
- රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
- රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම

## මණ්ඩලීය අරමුණු

- පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුලින් රජයට කරන දායකත්වය වැඩි කිරීම
- වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි කිරීම
- ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම
- පාරිභෝගික සංතුෂ්ටිය වැඩි කිරීම

## ආරම්භය සහ ප්‍රධාන සිදුවීම්

### ආරම්භය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුල ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. 1949 වසරේදී එවකට පළාත් පාලන කටයුතු පිලිබද අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිළිබද අදහස රජයට ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹනි.



★ **ආරම්භක අවධියේ ලොතරැයි දිනුම් ඇදීමක්**

1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුල ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. අරමුදල් සෞඛ්‍ය සේවාවන්වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සදහා අවශ්‍ය විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සදහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී.

## සංවිධාන පරමාර්ථ

- රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ඉපයීම
- රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
- රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම

## මණ්ඩලීය අරමුණු

- පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුලින් රජයට කරන දායකත්වය වැඩි කිරීම
- වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි කිරීම
- ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම
- පාරිභෝගික සංතුෂ්ටිය වැඩි කිරීම

# ආරම්භය සහ ප්‍රධාන සිදුවීම්

## ආරම්භය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනීමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුල ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. 1949 වසරේදී එවකට පළාත් පාලන කටයුතු පිලිබඳ අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිළිබඳ අදහස රජයට ඉදිරිපත් කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹුනි.



**★ ආරම්භක අවධියේ ලොතරැයි දිනුම් ඇදීමක්**


1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුල ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. අරමුදල් සෞඛ්‍ය සේවාවන්වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විය.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී.

## අධ්‍යක්ෂ මණ්ඩලය






01. චමින්ද අතුළුවගේ මහතා - සභාපති
02. ජානක ශ්‍රී වර්ණසිංහ මහතා - ක්‍රියාකාරි අධ්‍යක්ෂ
03. ආර්.ජේ.ටී.අබේවර්ධන මහතා - අධ්‍යක්ෂ
04. වී. එම්. අමීන් මහතා - අධ්‍යක්ෂ
05. සම්පත් දිසානායක මහතා - අධ්‍යක්ෂ
06. සමන් ගලප්පත්ති මහතා - නිරීක්ෂක





“ජාතික ලොතරැයි මණ්ඩල ඉතිහාසයේ ප්‍රථම වතාවට රු.බිලියන 10 ක පිරිවැටුමක් උපයා ගැනීමට හැකිවීම නිසා 2011 වසර අප සියළුදෙනාම ආඩම්බරයට පත්වන විශේෂිත වසරකි.”

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා මෙම සමාලෝචනය තුළින් ඔබ ඇමතීමට ලැබීම සතුටට කරුණකි.

ජාතික ලොතරැයි මණ්ඩල ඉතිහාසයේ ප්‍රථම වතාවට රු.බිලියන 10 ක පිරිවැටුමක් උපයා ගැනීමට හැකිවීම නිසා 2011 වසර අප සියළුදෙනාම ආඩම්බරයට පත්වන විශේෂිත වසරකි. අපගේ අධිෂ්ඨානය වුයේ මෙම ඉලක්කය සපුරා ගැනීම වන අතර මෙය පසුගිය වසරෙහි වාර්ෂික වාර්තාවේ මාගේ සමාලෝචනයේද පුරෝකථන යටතේ දක්වා තිබිණි.

## ආර්ථික වාතාවරණය

පෙර වර්ෂයේ 8% ඉක්මවු රටෙහි ආර්ථික වර්ධනය මෙම වසරෙහි 8.3% වු අතර එය ආර්ථිකයේ ස්ථිරභාවය පෙන්නුම් කරයි. පෙර වර්ෂයේ ඇ. ඩොලර් 2,400 ක් වු ඒක පුද්ගල ආදායම 2011 වසරේදි ඇ.ඩොලර් 2,836 ක්, එනම් 18.2% කින් වැඩිවී ඇති අතර 2016 දී ඇ.ඩොලර් 4,000 ක් දක්වා මෙය වැඩිකිරීමේ ප්‍රතිපත්තිමය ඉලක්කය බොහෝසෙයින් ලගාකර ගතහැකි බව මෙම වර්තමාන ප්‍රවණතාවයෙන් පෙන්නුම් කෙරේ.

කාර්මික ක්ෂේත්‍රයේ වර්ධනය 10.3% ක් වන විට සේවා ක්ෂේත්‍රයේ වර්ධනය 8.6% ක් වු අතර බහුතර අනිකුත් රටවල් සමග සසදා බලන විට එය සැලකිය යුතු වැඩිවීමකි. වර්ෂය ආරම්භයේ තිබු අහිතකර කාලගුණ තත්ත්වය නිසාවු බාධාවන් හේතුවෙන් කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයේ වර්ධනය 2% ක් පමණක් විය.

වර්ෂය අවසානයේ භාණ්ඩ කිහිපයක මිළ වැඩිවීම් තිබියදීත් සාමාන්‍ය වාර්ෂික උද්ධමනය එක් අංකනයකින් යුක්තව එනම් 6.7% ක් පමණ මට්ටමේ පවත්වා ගැනීමට හැකිවිය. සාර්ව ආර්ථික දත්තවල වර්ධනය, හා එමෙන්ම මුල්‍යමය ස්ථායිතාව ඉහළයාම තුළින් පෙන්නුම් කරන වැඩි දියුණුවීම් සැලකිල්ලට ගෙන ජාත්‍යන්තර ආයතන ශ්‍රී ලංකාවේ ප්‍රමාණන (rating ) තත්ත්වය ඉහළ තලයක තබා ඇත.

පසුගිය වසරේ ඉදිරිපත් කරන ලද 2012 වසරට අදාල ජාතික අයවැයෙන් සිදු කරන ලද බදු අඩුකිරීම්, පරිභෝජන ආදායම වැඩිකිරීමට ඉවහල්වන අතර එය ඉදිරි වසර සඳහා හිතකර තත්ත්වයක් පෙන්නුම් කරයි.

## කාර්යසාධනය

2011 වසරේ මණ්ඩලයේ සමස්ත කාර්යසාධනය විශිෂ්ට වන අතර සමස්තයක් වශයෙන් ගත් කල සෑම ලොතරැයියකම වර්ධනයක් වාර්තා කරයි. වර්ෂය ආරම්භයේ දේශගුණ වෙනස්වීම්, තදබල ගංවතුර තත්ත්වයන් නොවන්නට මෙම ප්‍රතිඵල මීටත් වඩා සුභවාදිවීමට ඉඩ තිබිණි. මෙම දුෂ්කරතා තිබියදීත් 2010 වාර්තා කරන ලද රු.මිලි 8,862 පිරිවැටුම සමග සසදන විට 2011 වසරේ එය රු. මිලියන 10,092 ක් වු අතර එය රු. මිලියන 1,229 ක වැඩිවීමකි. මෙය පෙර වසරට වඩා 13.8 %ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2008 වසරේ සැප්තැම්බර් මස ටිකට්පතෙහි මිල රු.20/- දක්වා වැඩිකිරීමට පෙර තිබු ප්‍රශස්ත අලෙවි ප්‍රමාණයේ මට්ටමට රු.20/- තිබියදීත් මෙලෙස අලෙවි ප්‍රමාණය වැඩිවීම අගය කළ යුත්තකි.

සාඩම්බර ඉතිහාසයක් ඇති දිවයිනේ වඩාත් ජනප්‍රිය ලොතරැයිය වන මහජන සම්පත ලොතරැයිය දෙසැම්බර් මාසයේ රු. මිලියන 409.9 ක පිරිවැටුමක් වාර්තා කරන ලද අතර මෙතෙක් මෙම ලොතරැයිය වාර්තා කරන ලද ඉහළම පිරිවැටුම වු 2006 සැප්තැම්බර් මාසයේදි උපයාගත් රු. මිලියන 411.8 ට ආසන්න මට්ටමටම පැමිණ ඇත. මහජන සම්පත ලොතරැයි දිනුම් ඇදීම ඉරිදා දිනයටද යෙදීම සාර්ථක වු අතර ශ්‍රම වාසනා හා සුවසෙත ලොතරැයි එක්ව විකුණු ටිකට්පත් 550,000 ට සාපේක්ෂව ගත් විට මෙම ලොතරැයියෙන් ටිකට්පත් මිලියන 1 ක් විකිණීමට හැකිවිය. මහජන සම්පත ලොතරැයියේ පිරිවැටුම ගත් විට එය මුළු පිරිවැටුමෙන් 40.5% ක් පමණ වේ.

ටිකට්පතෙහි මුහුණුවරෙහි සිදුකළ උපායමාර්ගික වෙනස්කම් නිසා පෙර වසරට වඩා ජාතික සම්පත ටිකට්පතෙහි අලෙවිය 60% කින් පමණ වැඩිවිය.

දෙසැම්බර් මාසයෙහි රු. මිලියන 106 ක අලෙවියක් ලගාකරගත් සෙවණ ක්ෂණික ලොතරැයිය එය එම ලොතරැයියේ දෙවන ඉහලම වාර්තාගත අලෙවිය කර ගැනීමට හැකි වු අතර ඉහල අලෙවිය වුයේ 1998 වසරේදි රු මිලියන 132 ක්ය.

2011 වසරේදි රු. මිලියන 10 ඉක්ම වු සුපිරි ත්‍යාගලාභීන් 21 දෙනෙක් බිහිකිරීමට මණ්ඩලය සමත් වු අතර එය පෙර වසරට වඩා 6කින් වැඩිවන (2010 වසරේ 15දෙනෙකු) අතර 2011 ඔක්තෝබර් මසදී සුපිරි ත්‍යාග ගෙවීමෙහි වාර්තාවක් තබමින් අඛණ්ඩව දින 4කදී සුපිරි ත්‍යාගලාභීන් 4 දෙනෙකු බිහිවිය. තවද නොවැම්බර් මස පළමු සතියෙහි තවත් සුපිරි ත්‍යාගලාභියෙකු බිහි වු අතර සති 3 ක් ඇතුලත සුපිරි ත්‍යාගලාභීන් 5ක් බිහිකිරීමට සමත් වීම නිසා වෙලදපලෙහි පාරිභෝගික විශ්වාසයක් විශාල වශයෙන් ඉහළ යාමට හේතු විය.



"2010 වසරේ රු. මිලියන 1,587.7 වු සමුච්චිත ලාභ හා සංචිතවලට සාපේක්ෂව 2011 වසරේ දෙසැම්බර් 31 දිනට එය රු. මිලියන 1,892.8 වේ."

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2011 වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සදහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඔබ වෙත ඉදිරිපත් කරමු.

## අඛණ්ඩ පැවැත්ම

ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යාම සදහා ප්‍රමාණවත් සම්පත් පැවතීම සම්බන්ධව අප සතුටු වන අතර මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ පැවැත්මේ පදනම" මත පිළියෙල කර ඇත.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ජාතික ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් දිනුම් අදින හා ක්ෂණික ලොතරැයි පැවැත්වීම වන අතර සමාලෝචිත වසරේදී මෙම ක්‍රියාකාරකම් ස්වභාවයේ කිසිදු වෙනසක් සිදු නොවිනි.

## මෙහෙයුම් සමාලෝචනය

පිටු අංක 14 සිට 17 දක්වා ඇති සභාපතිගේ සමාලෝචනයෙන් සමාලෝචිත වර්ෂය තුල ජාතික ලොතරැයි මණ්ඩලයේ කටයුතු හා විශේෂ සිදුවීම් සඳහන් කර ඇති අතර පිටු අංක 38 යටතේ ඇති නිෂ්පාදන විෂයධාරාවෙන් එක් එක් ලොතරැයියේ මෙහෙයුම් ප්‍රතිඵල පෙන්නුම් කරයි. විගණිත මූල්‍ය ප්‍රකාශන හා බැඳුනු මෙම වාර්තාවලින් මණ්ඩලීය කටයුතුවල තත්ත්වය තවදුරටත් විදහා දක්වයි.

2010 වසරේ රු. මිලියන 1,587.7 වු සමුච්චිත ලාභ හා සංචිතවලට සාපේක්ෂව 2011 වසරේ දෙසැම්බර් 31 දිනට එය රු. මිලියන 1,892.8 වේ. එහි විචලනය ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් ප්‍රකාශයේ සඳහන්ව ඇත. (පිටු අංක 27 )

අධ්‍යක්ෂවරුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට මණ්ඩලය විසින් ශේෂ පත්‍ර දිනට ගෙවිය යුතු බදු, අයබදු සහ අනිකුත් සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා සිදුකර හෝ ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇති බව සනාථ කරනු ලැබේ.

## මානව සම්පත් සංවර්ධනය

කළමණාකරනය විසින් දෙනු ලබන ඉලක්ක සපුරා ගැනීමට, ශ්‍රම බලකායේ දායකත්වය සුභවාදී ලෙස ලබාගැනිම සඳහා ඔවුන් අභිප්‍රේරණය කළයුතු බැවින්, සේවකයින් සඳහා විවිධ ප්‍රතිලාභ ලබාදීම අඛණ්ඩව සිදු කරන ලදී. ලොතරැයි විකුණුම් මත පදනම් වු දිරිදීමනා, වෛද්‍ය රක්ෂණ පහසුකම්, නිල ඇදුම් දීමනා, සහ ප්‍රවාහන දීමනා සේවකයින්ට ලබාදෙන ප්‍රතිලාභ සමහරක් අතර වේ. මාසිකව හොඳම සේවකයා තේරීමද මෙම අභිප්‍රේරක අතර වේ.

සේවක කාර්යසාධනය ඇගයීම සඳහා වු වැඩමුළු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ සහ කටුනායක ටැමරින්ඩ් ට්‍රී හෝටලයේදී පිළිවෙලින් 2011 අප්‍රේල් සහ ජුනි මාසයේදී පැවැත්විණි. ජාතික ලොතරැයි මණ්ඩලයේ ඉතිහාසය හා වර්තමාන ප්‍රගතිය පිළිබඳ සේවක මණ්ඩලය දැනුවත්කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්විණි.

සේවකයින්ට අනිකුත් අංශවල කාර්යභාරයන් පිළිබඳවද පුහුණුව ලබාගැනීමට අවස්ථාව දීම සඳහා මණ්ඩලයේ සියළුම සේවකයින් අනිකුත් අංශවලට මාරුකරමින් 2011 සැප්තැම්බර් 01 දින සිට සේවක ප්‍රතිව්‍යුහකරණයක් ඇති කරන ලදී.

## සාමුහික සමාජ වගකීම්

ආයතන ප්‍රතිරූප ප්‍රවර්ධන වැය ශිර්ෂය යටතේ මණ්ඩලය විසින් සාමුහික සමාජ වගකීම් අඛණ්ඩව සිදුකරන ලදී. සමාජ වගකීමක් ලෙස සමහර ව්‍යාපෘතීන් සඳහා අනුග්‍රහය දැක්විය යුතු අතර ඒ සඳහා උපරිම ප්‍රතිලාභ ලබාගැනීම අපගේ වගකීම වේ. එබැවින් අප විසින් දැයට කිරුළ ප්‍රදර්ශනය, විවිධ වාර්ෂික පෙරහැරවල් සහ ජාතික වැදගත්කමක් ඇති උත්සව විශාල ප්‍රමාණයක් සඳහා අනුග්‍රාහකත්වය සපයන ලදී.

## රජයට කරන ලද දායකත්වය

2010 වසරේ ඒකාබද්ධ අරමුදලට කල ඍජු ප්‍රතිපාදන හා බදු මගින් කරන ලද වක්‍ර ප්‍රතිපාදන ලෙස ගෙවන ලද රු. මිලියන 2,069.2 ට සාපේක්ෂව 2011 වසරේදී රු. මිලියන 2,038.8 ක් මණ්ඩලය විසින් රජයට ලබා දෙන ලදී. මෙය විස්තරාත්මකව පහත දක්වා ඇත.

2010 වසරේ දේපල යන්ත්‍ර හා උපකරණ සඳහා ආයෝජනය කරන ලද රු.මිලියන 22.1 හා සසඳන විට සමාලෝචිත වසරේදි රු මිලියන 3.6 ක් ආයෝජනය කරන ලදී.

පෙර වර්ෂයේ රු මිලියන 1.186.6 වු මෙහෙයුම් වියදම් සමග සසඳන විට සමාලෝචිත වර්ෂයට අදාලව එය රු. මිලියන 1,290.9 ක් එනම් 8.7% ක වැඩිවීමක් පෙන්නුම් කරන අතර පෙර වර්ෂයේදි මුළු පිරිවැටුමෙන් 13.3 %වු මෙම වියදම් මෙම වසරේදි 12.7 % ක් විය. මෙයින් පෙන්නුම් කරනුයේ මෙහෙයුම් වියදම් 8.7% කින් වැඩිවුවත් විකුණුම්වලට සාපේක්ෂව ප්‍රතිශතය පහලයාම තුළින් ධනාත්මක ප්‍රතිඵල ඇතිවී ඇති බවයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සමාලෝචිත වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| චමින්ද අතුළුවගේ මයා | - | සභාපති |
| ජානක ශ්‍රී වර්ණසිංහ මයා | - | ක්‍රියාකාරි අධ්‍යක්ෂ |
| ආර්.ජේ.ටී.අබේවර්ධන මයා | - | අධ්‍යක්ෂ |
| වී.එම්. අමීන් මයා | - | අධ්‍යක්ෂ |
| සම්පත් දිසානායක මයා | - | අධ්‍යක්ෂ |
| සමන් ගලප්පත්ති මයා | - | නිරීක්ෂක |

| රජයට කරන ලද දායකත්වය | 2011 රු.මිලි. | 2010 රු.මිලි. |
|---|---|---|
| **සෘජු ප්‍රතිපාදන** | | |
| ඒකාබද්ධ අරමුදලට කරන ලද දායකත්වය | 1,345.04 | 1,173.46 |
| භාරකාර අරමුදල හරහා | - | 146.70 |
| මහා භාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | 16.00 |
| | 1,345.04 | 1,336.16 |
| **වක්‍ර ප්‍රතිපාදන** | | |
| එකතු කළ වටිනාකම් මත බදු | 365.15 | 315.51 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 141.76 | 186.37 |
| ආදායම් බදු/ වක්‍ර බදු | 186.87 | 231.39 |
| | 693.78 | 733.27 |
| **රජයට කරන ලද මුළු දායකත්වය** | **2,038.82** | **2,069.43** |

| මූල්‍ය ප්‍රතිඵල | 2011 | 2010 | වෙනස |
|---|---|---|---|
| පිරිවැටුම | 10,092.33 | 8,862.86 | 1,229.47 |
| ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන | 8,077.35 | 7,107.75 | 969.60 |
| එකතු කල වටිනාකම් මත බදු | 365.15 | 315.52 | 49.63 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 141.76 | 186.38 | (44.62) |
| වෙනත් ආදායම් | 178.86 | 212.42 | (33.56) |
| මෙහෙයුම් වියදම් | 1,290.93 | 1,186.62 | 104.31 |
| බදු පෙර ශුද්ධ ලාභය | 395.98 | 263.03 | 132.95 |
| බදු පසු ශුද්ධ ලාභය | 209.10 | 31.63 | 177.46 |
| මුළු වත්කම් | 2,967.02 | 2,702.80 | 264.22 |
| මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධ ප්‍රාග්ධනය | 1,892.80 | 1.587.77 | 305.03 |
| බදු පෙර ශුද්ධ ලාභය පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 3.92% | 2.97% | - |
| බදු පෙර ශුද්ධ ලාභය මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 13.34% | 9.73% | - |
| බදු පෙර ශුද්ධ ලාභය ස්කන්ධ ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස | 20.92% | 16.56% | - |
| ද්‍රවශීලතා අනුපාතය | 2.55 :1 | 2.23:1 | - |

## සමාප්තිය

විශිෂ්ඨ ප්‍රතිඵල අත්පත්කර ගැනීම උදෙසා කැපවීම, විශ්වසනීයත්වය, නිර්මාණශීලිත්වය කැටිවුණු ඉතා හොඳ සේවයක් ලබාදීම වෙනුවෙන් කළමණාකාරිත්වය ඇතුළු සමස්ත සේවක මඩුල්ලට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

එමෙන්ම වසර පුරා අප කෙරේ විශ්වාසය තබමින් ලබාදුන් විශිෂ්ට සේවයට දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්ට, සාමාන්‍ය අලෙවි නියෝජිතයින්ට, අපගේ බැංකුකරුවන්ට, සැපයුම්කරුවන්ට, ටිකට්පත් මුද්‍රණ ආයතනවලට සහ ලොතරැයි විගණකවරුන්ට මණ්ඩලයේ ස්තුතිය පිරිනමනු කැමැත්තෙමි.



ජානක ශ්‍රී වර්ණසිංහ,
ක්‍රියාකාරි අධ්‍යක්ෂ,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2012 මාර්තු 30 දින,
කොළඹ.

# විගණන හා කළමණාකරන කමිටු වාර්තාව

## දළ විශ්ලේෂණය

විගණන හා කළමණාකරන කමිටුව එය ස්ථාපිත කරන ලද 2005 වසරේ සිටම අමිල සේවයක් සපයයි. මෙම කමිටුව 2011 වසරේදි නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර පහත සදහන් සාමාජික මණ්ඩලයෙන් සමන්විත වේ.

ආර්. ජේ.ටී. අබේවර්ධන මහතා – සභාපති

(විධායක නොවන අධ්‍යක්ෂ)

වී.එම්.අමීන් මහතා – සාමාජික

(භාණ්ඩාගාර නියෝජිත, විධායක නොවන අධ්‍යක්ෂ)

සම්පත් දිසානායක මහතා – සාමාජික

( විධායක නොවන අධ්‍යක්ෂ)

එස්. බාලසූරිය මිය – ලේකම්

(ස.සාමාන්‍යාධිකාරිනි නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

## නිරික්ෂකයින්

පී.විජේවර්ධන සහ සමාගම - අභ්‍යන්තර විගණක

නියෝජිත - විගණකාධිපති දෙපාර්තමේන්තුව

මෙම කමිටුව අවම වශයෙන් රැස්විය යුතු වාර ගණන 4ක් වුවත් (කාර්තුවකට එක බැගින්) රැස්වීම් වාර 8 ක් වසර තුල පවත්වන ලදී. සාමාන්‍යාධිකාරි හා ප්‍රධාන මූල්‍ය නිලධාරි කමිටුවේ ඉල්ලීම පරිදි සහභාගිවන අතර කළමණාකරනයේ අනිකුත් සාමාජිකයින් පැහැදිලි කිරීම් අවශ්‍යවන අවස්ථාවලදී කැදවයි.

## වගකීම්

විගණන හා කළමනාකරන කමිටුව මණ්ඩලයේ කාර්යසාධනය හා අනුකූලතාවය සමතුලිතව පවත්වා ගැනීම සදහා උපකාරි වෙයි. මණ්ඩලයේ වගකීම් විසර්ජනය, මන්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කිරීම, පාලන පරිසරයේ කාර්යසාධකත්වය තක්සේරු කිරීම සහ අභ්‍යන්තර හා බාහිර විගණකවරුන්ගේ ස්වාධිනත්වය හා විෂය මූලිකත්වය සුරක්ෂිත කිරීම කමිටුවේ අභිමතාර්ථය වේ.

මූල්‍ය ප්‍රකාශන හා අනිකුත් වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය නිර්දේශයන් ලබාදෙයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි උපයෝගි කරගන්නා විශේෂ ගිණුම්කරන ප්‍රතිපත්තීන් පිළිබද හා ඉදිරිපත් කිරීම පිලිබද කමිටුවේ විශේෂ අවධානය යොමු කෙරේ. තවද කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන වාර්තා, හා දිගු කලක් තිස්සේ නොවිසදී ඇති ගැටළු ආදිය පිළිබදවද සමාලෝචනය කරන අතර අවශ්‍ය නිර්දේශයන් ලබාදෙයි. සෑම කමිටු රැස්වීමකම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අතර එය තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සමාලෝචනය කෙරේ.

ඵලදායි අභ්‍යන්තර පාලනයන් ක්‍රියාත්මක කිරීම හා සමස්ත පාලන ක්‍රමවේදයන් හා පරිසරය දියුණු කිරීම සහතික කරනු වස් අභ්‍යන්තර විගණන නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබද කමිටුව විසින් පසු විපරම් කරනු ලැබේ.

වැඩි ස්වාධිනත්වය සදහා ජාතික ලොතරැයි මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු පිළිගත් බාහිර ආයතනයක් විසින් සිදු කරනු ලැබේ. ක්‍රියාත්මක වෙමින් පවතින විගණන නිර්දේශයන් නිර්ණය කිරීම සදහා පසු විපරම් කටයුතු උපලේඛන ගත කොට ඇත.

සමාලෝචිත වසර තුල කමිටුවේ රාජකාරි හා වගකීම් ඵලදායි ලෙස කරගෙනයාම සදහා ශක්තියක් වන තොරතුරු සහ අවශ්‍ය සහයෝගය කළමනාකාරිත්වයෙන් කමිටුවට ලැබිනි.

## අනුකූලතාවය

පිළිගත් ප්‍රතිපත්තීන්වලට අනුකූලව මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු මෙහෙය වු බවට මණ්ඩලයේ මෙහෙයුම් පාලනයන් හා ගිණුම්කරණ ප්‍රතිපත්තින් සාධාරණ සහතිකයන් සපයන බව විගණන කමිටුව පිලිගන්නා අතර කමිටුව ඒ පිළිබද සෑහිමකට පත්වේ.

ආර්. ජේ. ටී. අබේවර්ධන,
සභාපති,
විගණන හා කලමණාකරන කමිටුව,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2012 මාර්තු 30 දින,
කොළඹ.

# මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු



## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ආදායම් සටහන

| | සටහන් | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| පිරිවැටුම එකතු කල වටිනාකම් මත බදු ඇතුළුව | 01 | **10,092,330,623** | **8,862,869,826** |
| අඩුකළා: නියෝජිත කොමිස් | 02 | 1,874,354,373 | 1,638,501,705 |
| ත්‍යාග සඳහා වෙන්කිරීම් | 03 | 4,857,951,333 | 4,295,786,207 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 04 | 1,345,046,907 | 1,173,460,051 |
| එකතු කළ වටිනාකම් මත බදු පෙර මණ්ඩලීය ආදායම | | **2,014,978,010** | **1,755,121,863** |
| අඩුකළා : එකතු කල වටිනාකම් මත බදු | | 365,159,981 | 315,515,516 |
| ජාතිය ගොඩ නැගීමේ බදු | | 141,767,911 | 186,375,756 |
| එකතු කළ වටිනාකම් මත බදු පසු මණ්ඩලීය ආදායම | | **1,508,050,118** | **1,253,230,591** |
| එකතු කළා:වෙනත් ආදායම් | | 178,866,138 | 212,424,233 |
| අඩු කළා :වියදම් | | | |
| බෙදා හැරීම් පිරිවැය | 05 | 12,429,908 | 7,992,173 |
| පරිපාලන වියදම් | 06 | 302,061,060 | 292,493,432 |
| වෙනත් වියදම් | 07 | 950,635,412 | 856,202,031 |
| මූල්‍ය පිරිවැය | | 25,807,844 | 29,936,142 |
| මුළු වියදම් | | **1,290,934,224** | **1,186,623,778** |
| අඩුකළා; මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | | - | 16,000,000 |
| බදු පෙර අතිරික්තය | | **395,982,032** | **263,031,046** |
| අඩුකළා :බදු සඳහා ප්‍රතිපාදන | | 186,878,002 | 231,393,156 |
| **වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය** | | **209,104,029** | **31,637,890** |

## දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | | 387,408,346 | 383,088,713 |
| කුලී සින්නක්කර දේපල | | 795,016 | 757,620 |
| මුළු ජංගම නොවන වත්කම් | | **388,203,362** | **383,846,333** |
| ක්‍රියාත්මක තත්ත්වයේ පවතින වැඩ | | 5,331,951 | - |
| **ජංගම වත්කම්** | | | |
| ලිපිද්‍රව්‍ය හා තොග | 08 | 71,715,536 | 71,799,991 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 09 | 170,596,728 | 206,637,373 |
| තැන්පතු හා පෙර ගෙවුම් | | 10,638,724 | 6,180,673 |
| මුදල් හා මුදලට සමාන දෑ | | 2,320,535,435 | 2,034,333,063 |
| මුළු ජංගම වත්කම් | | **2,573,486,423** | **2,318,951,101** |
| මුළු වත්කම් | | **2,967,021,736** | **2,702,797,434** |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| මුළු ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත ස්කන්ධ ප්‍රාග්ධනය | | | |
| සංචිත | | 1,892,802,542 | 1,587,766,210 |
| මුළු ස්කන්ධ , ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත ස්කන්ධ ප්‍රාග්ධනය | 10 | **1,892,802,542** | **1,587,766,210** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 53,569,595 | 62,075,804 |
| විලම්භිත බදු | | 14,787,878 | 15,953,117 |
| මුළු ජංගම නොවන වගකීම් | | **68,357,473** | **78,028,921** |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු ගෙවීම් | 11 | 783,875,058 | 718,990,586 |
| ගෙවිය යුතු එකතු කළ වටිනාකම් මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු | | 32,679,128 | 32,900,264 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 22,630,707 | 137,514,156 |
| උපචිත වියදම් | | 166,676,830 | 147,597,297 |
| මුළු ජංගම වගකීම් | | **1,005,861,722** | **1,037,002,303** |
| මුළු වගකීම් | | **1,074,219,196** | **1,115,031,224** |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | **2,967,021,737** | **2,702,797,434** |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ.

චමින්ද අතුළුවගේ
සභාපති,
දිනය . 29.02.2012

ජානක ශ්‍රී වර්ණසිංහ
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

හර්ෂ බණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලා යාම** | | |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 395,982,032 | 263,031,046 |
| අඩුකළා; පසුගිය වර්ෂය සඳහා ගැලපීම්- තොරතුරු තාක්ෂණය සඳහා කරන ලද අතිරික්ත ප්‍රතිපාදන | 33,859,196 | - |
| ආදායම් සංචිතයේ වැඩිවීම් /(අඩුවීම්) – රාජ්‍ය ආයතන සඳහා ඇති | | |
| අතිරික්ත භාරකාර අරමුදල් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීම් | - | (24,948,982) |
| ත්‍යාග සංචිතයේ වැඩිවීම් /(අඩුවීම්) | 62,073,107 | (24,189,783) |
| ගොඩනැගිලි සංචිතයේ වැඩිවීම් / (අඩුවීම්) | - | (38,157,266) |
| | **491,914,335** | **175,735,015** |
| **ගැලපීම් සඳහා** | | |
| ක්ෂය කිරීම් | 35,522,247 | 48,204,463 |
| විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන | 3,620,091 | 29,653,729 |
| එකතු කල වටිනාකම් මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ප්‍රතිපාදන | 506,927,892 | 501,891,271 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ | (2,583,438) | (2,760,280) |
| ත්‍යාග සඳහා ප්‍රතිපාදන | 4,857,951,333 | 4,295,786,207 |
| ඒකාබද්ධ අරමුදල සඳහා වෙන් කිරීම් | 1,345,046,907 | 1,173,460,051 |
| | **7,238,399,366** | **6,221,970.456** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්** | | |
| ලිපිද්‍රව්‍ය /තොග (වැඩිවීම්)/ අඩුවීම් | 84,455 | (6,464,732) |
| මහාභාණ්ඩාගාරය ගොඩනැගිලි අරමුදල (වැඩිවීම්)/ අඩුවීම් | - | 24,945,898 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු ගිණුම්වල (වැඩිවීම්)/ අඩුවීම් | 36,040,645 | (24,069,758) |
| තැන්පතු හා පෙර ගෙවුම්වල (වැඩිවීම්)/ අඩුවීම් | (4,458,052) | (431,178) |
| උපචිත වියදම්වල වැඩිවීම්/ (අඩුවීම්) | 2,490,525 | 40,557,400 |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලා යාම** | **7,272,556,940** | **6,256,508,086** |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| ජංගම නොවන වත්කම්වල වැඩිවීම | (45,211,227) | (22,166,974) |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ | 2,583,438 | 3,950,282 |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලා යාම** | **(42,627,790)** | **(18,216,692)** |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| ඒකාබද්ධ අරමුදල් සඳහා ගෙවීම් | (1,273,728,511) | (1,136,903,820) |
| ත්‍යාග සඳහා ගෙවීම් | (4,847,796,249) | (4,311,011,946) |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ගෙවීම් | (12,126,300) | (5,769,850) |
| එකතු කල වටිනාකම් මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම | (507,149,028) | (498,383,096) |
| ආදායම් බදු ගෙවීම | (302,926,691) | (189,083,135) |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **(6,943,726,779)** | **(6,141,151,847)** |
| වර්ෂය තුල මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම් | 286,202,372 | 97,139,547 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ | 2,034,333,063 | 1,937,193,516 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ** | **2,320,535,435** | **2,034,333,063** |
| **අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්**<br>**මුදල් හා මුදලට සමාන දෑ** | **2011** | **2010** |
| කෙටි කාලීන ආයෝජන | 2,095,122,234 | 1,917,456,521 |
| අතැති මුදල් හා බැංකු ශේෂ | 225,413,201 | 116,876,542 |
| **වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ** | **2,320,535,435** | **2,034,333,063** |

## දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් ප්‍රකාශය

| | ගොඩනැගිලි සංචිත රු. | ත්‍යාග සංචිත රු. | ආදායම් සංචිත රු. | එකතුව 2011 රු. |
|---|---|---|---|---|
| **01/01/2009 දිනට ශේෂය** | **657,000,000** | **708,827,935** | **277,596,416** | **1,643,424,351** |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම | - | 59,462,686 | - | 59,462,686 |
| රාජ්‍ය ආයතන සඳහා ඇති අතිරික්ත භාරකාර අරමුදලින් ඒකාබද්ධ අරමුදලට මාරුකිරීම | (38,157,266) | (83,652,469) | (24,948,982) | (146,758,717) |
| 2010 වසර සඳහා ශුද්ධ ලාභය | - | - | 31,637,890 | 31,637,890 |
| **2010.12.31 දිනට ශේෂය** | **618,842,734** | **684,638,152** | **284,285,324** | **1,587,766,210** |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම් | - | 62,073,107 | - | 62,073,107 |
| ආදායම් බදු සඳහා වෙන් කරන ලද අතිරික්ත ප්‍රතිපාදන | - | - | 33,859,196 | 33,859,196 |
| 2011 වසරෙහි ශුද්ධ ලාභය | - | - | 209,104,029 | 209,104,029 |
| **2011.12.31 දිනට ශේෂය** | **618,842,734** | **746,711,259** | **527,248,549** | **1,892,802,542** |

## ගිණුම් සඳහා සටහන්

| සටහන 01 - දළපිරිවැටුම | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| මහජන සම්පත | 4,094,195,000 | 3,501,117,200 |
| වාසනා සම්පත | 1,080,006,800 | 969,626,200 |
| ගොවිසෙත | 1,285,523,000 | 1,148,930,400 |
| සුපිරි වාසනා | 1,820,857,400 | 930,481,800 |
| ජයවිරු | 153,484,400 | 805,344,400 |
| ශ්‍රම වාසනා | - | 49,088,200 |
| සුවසෙත | - | 80,860,800 |
| ජාතික සම්පත | 786,494,800 | 492,754,800 |
| කළම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ | - | 34,252,526 |
| නව ගුවන්තොටුපල ලොතරැයිය | 5,092,723 | - |
| සමෘද්ධි | 95,606,020 | 96,543,250 |
| සෙවණ | 771,070,480 | 753,870,250 |
| **එකතුව** | **10,092,330,623** | **8,862,869,826** |

| සටහන 02 - නියෝජිත කොමිස් | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| මහජන සම්පත | 767,619,363 | 656,391,062 |
| වාසනා සම්පත | 202,492,378 | 181,759,984 |
| ගොවිසෙත | 241,024,094 | 215,401,995 |
| සුපිරි වාසනා | 341,392,113 | 174,419,888 |
| ජයවිරු | 28,777,885 | 150,984,226 |
| ශ්‍රම වාසනා | - | 9,202,361 |
| සුවසෙත | - | 15,157,508 |
| ජාතික සම්පත | 147,460,416 | 92,383,490 |
| නව ගුවන්තොටුපල ලොතරැයිය | 85,347 | - |
| සමෘද්ධි | 15,105,863 | 15,253,844 |
| සෙවණ | 130,396,914 | 127,547,350 |
| **එකතුව** | **1,874,354,373** | **1,638,501,708** |

| සටහන 03 - ත්‍යාග සඳහා වෙන් කිරීම් | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| මහජන සම්පත | 2,006,155,550 | 1,715,645,948 |
| වාසනා සම්පත | 507,603,196 | 463,757,320 |
| ගොවිසෙත | 604,195,810 | 550,367,835 |
| සුපිරි වාසනා | 855,989,748 | 445,379,022 |
| ජයවිරු | 72,137,668 | 385,267,208 |
| ශ්‍රම වාසනා | – | 25,034,982 |
| සුවසෙත | – | 41,239,008 |
| ජාතික සම්පත | 369,652,556 | 235,219,060 |
| කළම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ | – | 11,723,123 |
| නව ගුවන්තොටුපල ලොතරැයිය | 3,837,000 | – |
| සමෘද්ධි | 46,846,950 | 47,517,173 |
| සෙවණ | 391,532,855 | 374,635,529 |
| **එකතුව** | **4,857,951,333** | **4,295,786,207** |

| සටහන 04 - ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| මහජන සම්පත | 675,542,175 | 577,684,338 |
| වාසනා සම්පත | 178,201,122 | 159,988,323 |
| ගොවිසෙත | 128,552,300 | 114,893,040 |
| සුපිරි වාසනා | 182,085,740 | 93,048,180 |
| ජයවිරු | 15,348,440 | 80,534,440 |
| ශ්‍රම වාසනා | – | 4,908,820 |
| සුවසෙත | – | 8,086,080 |
| ජාතික සම්පත | 78,649,480 | 49,275,480 |
| සමෘද්ධි | 9,560,602 | 9,654,325 |
| සෙවණ | 77,107,048 | 75,387,025 |
| **එකතුව** | **1,345,046,907** | **1,173,460,051** |

| සටහන 05 - බෙදාහැරීම් පිරිවැය | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| ටිකට්පත් ප්‍රවාහන වියදම් | 4,702,971 | 4,368,443 |
| නියෝජිත සහන /ආපසු භාරදුන් ටිකට්පත්වල වටිනාකම | 501,273 | 1,761,730 |
| දිස්ත්‍රික් නියෝජිත සහ අලෙවි නියෝජිත පුහුණුකිරීම් | 25,675 | – |
| නියෝජිතයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම | 959,000 | – |
| දිස්ත්‍රික් නියෝජිතයින් හා අලෙවි නියෝජිතයින් සඳහා අලෙවි ප්‍රවර්ධන දිරිදීමනා | 2,817,228 | – |
| නියෝජිත වෛද්‍ය රක්ෂණය | 2,268,000 | 1,862,000 |
| අතිරේක අලෙවි ප්‍රවර්ධනය - නියෝජිතයින් සඳහා | 1,155,761 | – |
| **එකතුව** | **12,429,908** | **7,992,173** |

| සටහන 06 - පරිපාලන වියදම් | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| සේවක වියදම් | 203,294,269 | 203,535,560 |
| වෙනත් පරිපාලන වියදම් | 98,766,791 | 88,957,872 |
| **එකතුව** | **302,061,060** | **292,493,432** |

| සටහන 07 - වෙනත් වියදම් | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| ආයතනික වියදම් | 54,735,284 | 69,841,336 |
| ටිකට්පත් මුද්‍රණ වියදම් | 376,528,826 | 293,504,383 |
| අලෙවි හා විකිණුම් ප්‍රවර්ධන | 496,428,627 | 470,189,405 |
| සන්නිවේදන වියදම් | 22,942,675 | 22,666,907 |
| **එකතුව** | **950,635,412** | **856,202,031** |

| සටහන 08 - ලිපිද්‍රව්‍ය / තොග | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| මුද්‍රිත වියදම් | 48,857,409 | 45,869,797 |
| කඩදාසි හා ලිපිද්‍රව්‍ය | 2,457,918 | 1,794,429 |
| ත්‍යාග | 19,342,943 | 23,221,954 |
| පාරිභෝජිත ද්‍රව්‍ය | 1,002,766 | 836,812 |
| දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් පරිගණක තොග | 54,500 | 77,000 |
| **එකතුව** | **71,715,536** | **71,799,991** |

| සටහන 09 - වෙළඳ හා වෙනත් ලැබිය යුතු | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| ස්වීප් / වෙළඳ ණය ගැතියෝ | 46,868,675 | 62,696,832 |
| අගරු චෙක්පත් - සෙවණ සහ සමෘද්ධි | 1,405,967 | 1,490,445 |
| | 48,274,642 | 64,187,277 |
| අඩුකළා බොල් ණය ප්‍රතිපාදන | (29,403,277) | (29,453,197) |
| | 18,871,365 | 34,734,080 |
| වෙනත් ණය ගැතියන් / ලැබිය යුතු ගෙවීම් | 48,708,636 | 30,241,167 |
| ලැබිය යුතු ගිණුම් | 32,655,029 | 52,520,085 |
| සේවක ණය | 96,594,542 | 101,441,788 |
| විලම්භිත අයභාර වියදම් - කලම්බු එයාර්පෝට් සුපර් ඩ්‍රෝ සහ නව ගුවන් තොටුපල ලොතරැයිය | (26,232,843) | (12,299,745) |
| **එකතුව** | **170,596,728** | **206,637,373** |

| සටහන 10 - සංචිත | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| ගොඩනැගිලි සංචිත | 618,842,734 | 618,842,734 |
| ත්‍යාග සංචිත | 746,711,260 | 684,638,153 |
| ආදායම් සංචිත | 527,248,549 | 284,285,324 |
| **එකතුව** | **1,892,802,542** | **1,587,766,211** |

| සටහන 11 - ගෙවිය යුතු ගෙවීම් | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ගෙවීම් | 214,388,391 | 143,069,995 |
| ලොතරැයි මුදල් අත්තිකාරම් | 84,466,045 | 83,429,479 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 433,573,272 | 423,418,188 |
| වෙළඳ හා වෙනත් ණය හිමියෝ | 51,447,351 | 69,072,924 |
| **එකතුව** | **783,875,058** | **718,990,586** |

# විශේෂ ගිණුම්කරන ප්‍රතිපත්තීන්

## 1. සාමාන්‍ය ගිණුම්කරන සම්මුතීන්

### 1.1.1

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ පිළිගත් ගිණුම්කරන ප්‍රතිපත්තීන් හා ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 1971 අංක 38 දරන මුදල් පනතේ ප්‍රතිපාදනවලට අදාළව ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශන කෙරේ බලපාන උද්ධමනකාරි බලපෑම්වලට අදාල ගැලපීම් කර නැත.

### 1.1.2 සෙවණ ලොතරැයිය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ තිබූ සෙවණ ලොතරැයිය 1997 නොවැම්බර් 07 දින ජාතික ලොතරැයි මණ්ඩලය යටතට පවරන ලදී. සෙවණ ලොතරැයිය ජාතික ලොතරැයි මණ්ඩලය සමග ඒකාබද්ධ කිරීම වෙනුවට එය ජාතික ලොතරැයි මණ්ඩලයේ එක් නිෂ්පාදනයක් ලෙස සලකන ලද අතර ගිණුම් කටයුතු ඒ අනුව සිදුකරන ලදී.

ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අවස්ථාවන්හිදි ප්‍රමාණවත් එළිදරව් කිරීම් කර ඇත.

### 1.1.3 මුදල් වර්ෂය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන ලිත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

### 1.1.4 සන්සන්දනාත්මක තොරතුරු

සන්සන්දනාත්මක අවශ්‍යතා සඳහා පෙර වර්ෂයේ සංඛ්‍යා ප්‍රතිගණනය කර දක්වා ඇත.

## 1.2. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### 1.2.1

#### සින්නක්කර දේපල යන්ත්‍ර හා උපකරණ

දේපල යන්ත්‍ර හා උපකරණ සමුච්චිත ක්ෂය අඩු කිරීම් පසු පිරිවැයට දක්වා ඇත.

වත්කමක් අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම් හෝ ඉදිකිරීම් සමග වත්කමක් බලාපොරොත්තු වූ වැඩිකිරීමේ මට්ටමට ගෙන ඒමේ වියදම් යන සියල්ලම වත්කම් පිරිවැය යටතට ගැනේ. ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සඳහා හෝ ව්‍යාපාරයේ ඉපයුම් ධාරිතාවය ඉහල නැංවීමේ අරමුණින් වත්කමක් අත්පත් කර ගැනීම වැඩි කිරීම, වැඩිදියුණු කිරීම සඳහා යන ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

### 1.2.2 කුලී සින්නක්කර දේපල

කුලී සින්නක්කර දේපල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 – කල්බදු වලට අදාලව පවත්නා වටිනාකමට දක්වා ඇත. මෙම පවත්නා වටිනාකම පවතින කල්බදු නියමයන් හෝ උපයෝගි ජීවිත කාලය යන දෙකින් අඩු එකට ක්‍රමක්ෂණය කර ඇත.

ජංගම නොවන වත්කම්වල අනුරාධපුරයේ පිහිටි කුලී සින්නක්කර දේපල අඩංගු වේ. 1986 වසරේදි අවුරුදු 30 ක කුලී සින්නක්කර පදනම මත ලබාගන්නා ලද මෙම ඉඩමෙහි මණ්ඩලය විසින් සංචාරක නිවාසයක් ලෙස ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.

#### 1.2.2.1 ප්‍රකෘති පිරිවැය

මූලික කාර්යසාධනයේ තක්සේරු කිරීම්වලින් තහවුරු කරනු ලබන අනාගතයේදි ලැබේයැයි අපේක්ෂා කළ හැකි ආර්ථික වාසි සඳහා දේපල යන්ත්‍ර හා උපකරණ නඩත්තුව හා අලුත්වැඩියා සඳහා යන වියදම ප්‍රකෘති පිරිවැය යටතේ දක්වා ඇත.

#### 1.2.2.2 ක්ෂය කිරීම්

වත්කමක ඇස්තමේන්තුගත ආර්ථික ජීවිත කාලය තුල ලියාහරිනු වස් එම වත්කම් සින්නක්කර ඉඩම් හැර දේපල, යන්ත්‍ර හා උපකරණවල පිරිවැය හෝ තක්සේරු අගයට සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපාදන අනුපාත පහත පරිදි වේ.

| වත්කම | ක්ෂය අනුපාතය % |
|---|---|
| මෝටර් රථ | 25 |
| පරිගණක | 25 |
| වායු සමීකරණ,<br>සාමාන්‍ය සහ කාර්යාලීය උපකරණ | 20 |
| දිනුම් ඇදීම් යන්ත්‍ර/ලොතරැයි උපකරණ | 20 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10 |
| ගොඩනැගිලි හා විජේදනය | 05 |

වත්කමක උපයෝගි ජීවිත කාලය, අවශේෂ වටිනාකම, හා වත්කම් නිරීක්ෂණය සඳහා වූ ක්ෂයකිරීමේ විධික්‍රම අනුව සෑම මුදල් වර්ෂයකම අවසානයේ අවශ්‍ය නම් ගැලපීම් කොට දක්වයි. දැනට පවතින කල්බදු කාලපරිච්ඡේදය වන අවු. 6 තුල අවුරුදු 30 කුලී සින්නක්කර පදනම මත ලබාගත් දේපල(අනුරාධපුර සංචාරක නිවාසය) සමානව ක්‍රමක්ෂණය කරයි.

### 1.2.3 තොග

තොග පිරිවැය මත තක්සේරු කර ඇත. පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය යටතේ තොග නිශ්චය කර ඇති අතර අත්පත් කර ගැනීමේ පිරිවැය, දැනට තිබෙන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමේදී දැරීමට සිදුවන වියදම්, වෙනත් වියදම්ද ඇතුළත් කොට ඇත.

### 1.2.4 වෙළඳ හා වෙනත් ලැබිය යුතු හිණුම්

ඉදිරියේදි අයකර ගත හැකි යැයි අපේක්ෂිත ණය ප්‍රමාණයන් ණය ගැතියන් යටතේ දක්වා ඇත. බොල් ණය හා අඩමාන ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත. වෙනත් ලැබිය යුතු හා හිග මුදල් පිරිවැය යටතේ පෙන්නුම් කරයි.

### 1.2.5 මුදල් හා මුදලට සමාන දෑ

#### 1.2.5.1

අතැති මුදල්, ඉහළ ද්‍රවශිලතා අගයක් ඇති ඉක්මනින් මුදල් කළ හැකි, මුදල් බවටපරිවර්තනය කිරීමේදි සැලකිය යුතු අවදානමක් නැති කෙටිකාලීන ආයෝජන, මුදල් හා මුදලට සමාන දෑ යටතේ නිර්වචනය කර ඇත.

#### 1.2.5.2

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර සුරැකුම්පත්, භාණ්ඩාගාර ආයෝජන හා ස්ථිර බැංකු තැන්පතුවල ඇති කෙටිකාලීන ආයෝජන ශේෂ පත්‍ර දිනට ලැබිය යුතු පොලිය හා පිරිවැය එක්ව පෙන්නුම් කොට ඇත. සියළුම ආයෝජන කෙටිකාලීන ලෙස සලකා ඇත.

## 1.3. වගකීම් හා ප්‍රතිපාදන

### 1.3.1 වගකීම්

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි සියළුම වගකීම් ගිණුම් ගත කර ඇත.

### 1.3.2 ජංගම වගකීම්

ඉල්ලූ විට හෝ ශේෂ පත්‍ර දින සිට වසරක් ඇතුළත ගෙවීමට ඇති ගෙවීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

### 1.3.3 ජංගම නොවන වගකීම්

ශේෂ පත්‍රයේ දින සිට වසරකට පසු ගෙවීමට ඇති ගෙවීම් ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

### 1.3.4 විශ්‍රාම පාරිතෝෂික

#### 1.3.4.1 සේ. අ. අ. හා සේ. භා. අරමුදල් වල අර්ථ නිරූපිත දායකත්ව සැලැස්ම

සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇති සියළුම සේවකයින් අදාල දායක අරමුදලට විෂය වූ සියළුම කරුණුවලින් හා රීතීන් මගින් ආවරණය වේ.

සේ.අ.අ. හා සේ.භා. අරමුදල්වල දායකත්ව සඳහා කරන ලද දායකත්වය ආදායම් සටහනේ වියදම් යටතේ දක්වා ඇත.

#### 1.3.4.2 අර්ථ නිරූපිත විශ්‍රාම පාරිතෝෂික දීමනා උපකාරක සැලැස්ම

මණ්ඩලයේ වසර පහක අඛණ්ඩ සේවාවක් සපුරන ලද සියළුම සේවකයින් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ප්‍රතිපාදනවලට යටත්ව විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන

සලසා ඇත.

විශ්‍රාම පාරිතෝෂික සැලසීම සඳහා මණ්ඩලය ප්‍රවීන ආයතනයකින් ආයුගණක වාර්තාවක් ලබා ගන්නා ලද අතර ශ්‍රී ලංකා ගණකාධිකරන ප්‍රමිති අංක 16 යටතේ ඇති නිර්දේශ පරිදි පුරෝකථිත ඒකක බැර යොදා ගෙන (PUC) විශ්‍රාම පාරිතෝෂික ගණනය කර ඇත.

ප්‍රතිපාදන ප්‍රමාණය වූ රු.29,653,729/- ට සාපේක්ෂව පවත්නා වර්ෂයේදී රු.3,620,091/- ක ප්‍රතිපාදන මේ සඳහා සලසා ඇත.

### 1.3.5 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගෙවීම්

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගෙවීම් පිරිවැය මත පෙන්නුම් කර ඇත.

## 1.4. බදුකරණය

### 1.4.1 වර්තමාන බදු

ආදායම් බදු ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලද ආදායම් හා වියදම් මූලිකාංග මත පදනම් වී ඇති අතර දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව ගණනය කර ඇත.

### 1.4.2 විලම්භිත බදු

වත්කම් හා වගකීම් පදනම්වූ බදු අතර හා මූල්‍ය වාර්තා කිරීම් අවශ්‍යතා සඳහා ඉදිරියට ගෙන ආ වටිනාකම්වල ශේෂ පත්‍ර දිනට පවතින සියළුම තාවකාලික වෙනස්කම් සඳහා වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත අයභාර බදු ප්‍රතිපාදනය කර ඇත.

## 1.5. අසම්භාව්‍ය වගකීම්

### 1.5.1 ඒකාබද්ධ අරමුදලට දායකත්ව මත ආදායම් බදු

2007/2008, 2008/2009 සහ 2009/2010 තක්සේරු වර්ෂවලට අදාලව ඒකාබද්ධ අරමුදලට ගෙවන ලද රු. බිලියන 2.8 මුදල මත අතිරේක ආදායම් බද්දක් මණ්ඩලය මත පැනවිනි. වරලත් ගණකාධිකාරී සමාගමක් මගින් මණ්ඩලය මේ සඳහා අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර එම අභියාචනය ප්‍රතික්ෂේප වුවහොත් මණ්ඩලයට මේ සඳහා රු. බිලියන 1.1 ගෙවීමට සිදුවේ.

### 1.5.2 හිමිකම් ත්‍යාග

ත්‍යාග හිමි ටිකට්පතක් ඉදිරිපත් කරන ලද දිනුම් හිමියෙකුට මණ්ඩලය විසින් ත්‍යාගය ගෙවන ලද අතර එකී ටිකට්පත පදනම් කරගෙන තවත් හිමිකරුවෙක් මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මණ්ඩලයට ඔහු සඳහා රු'2,000,000 ක් ගෙවීමට සිදුවිය හැක.

## 1.6. ආදායම් ප්‍රකාශය

### 1.6.1 පිරිවැටුම

මුදල් වර්ෂය තුල පවත්වන ලද ලොතරැයි දිනුම්වාරවල අලෙවි වූ ටිකට්පත්වල වටිනාකම දල ආදායමින් දැක්වේ.

### 1.6.2 අයභාර වියදම්

වර්ෂයට අදාල අතිරික්ත ආදායම ලගා කර ගැනීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යාම හා වත්කම් නඩත්තු කිරීම සඳහා දැරීමට සිදුවන සියළුම වියදම් අයභාර වියදම් යටතේ දක්වා ඇත.

### 1.6.3 ණය ගැනුම් පිරිවැය

ණය ගැනුම් පිරිවැය එම වියදම් දරන කාල පරිච්ඡේදය අනුව වියදමක් ලෙස දක්වනු ලැබේ.

### 1.6.4 දේපල, යන්ත්‍ර උපකරණ හා ආයෝජන විකිණීම

දේපල, යන්ත්‍ර උපකරන හා ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලැබුනු ලාභ හෝ පාඩු ආදායම් හා වියදම් සටහනෙහි ගිණුම්ගත කොට ඇත.

## 1.7. ආදායම් තහවුරුව

### 1.7.1 ලොතරැයි අලෙවි ආදායම උපචිත පදනමින් දක්වා ඇත.

### 1.7.2 පොලී ආදායම කාල පදනම මත දක්වා ඇත.

### 1.7.3 වෙනත් ආදායම්ද උපචිත පදනම මත දක්වා ඇත.

## 1.8 අරමුදල් බෙදාහැරීම

ආරෝග්‍යශාලා ලොතරැයියේ අනුප්‍රාප්තික ලෙස 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය සංස්ථා ගත කර ඇත.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව 2008 සැප්තැම්බර් 02 දින සිට බල පැවැත්වෙන පරිදි ටිකට්පතක මිල රු. 10/ සිට රු.20/ දක්වා වැඩිකරන ලදී. සියළුම දිනුම් අදින ලොතරැයි සඳහා දළ ආදායමින් 51% ත්‍යාග ලෙස වෙන් කර නව ත්‍යාග රටාවන් හඳුන්වා දෙන ලදී. ඒ අනුව නියෝජිත කොමිස් ද 15 %සිට 17.5% දක්වා වැඩි කරන ලදී.

2010 ජූනි මස සිට මහජන සම්පත ලොතරැයිය හැර සියළුම දිනුම් අදින ලොතරැයිවල ත්‍යාග සඳහා වෙන් කිරීම් ප්‍රතිශතය 49 %සිට 47% දක්වා අඩු කර ඇත.

2010 වසරේදී සුවසෙත ශ්‍රම වාසනා ලොතරැයි නවතා දමන ලද අතර ඒ වෙනුවට ජාතික සම්පත ලොතරැයිය හඳුන්වා දෙන ලදී. සුවසෙත සහ ජාතික සම්පත වෙනුවට ඉරිදා දින සඳහා මහජන සම්පත ලොතරැයිය හඳුන්වා දෙන ලද අතර එම කාලයේදීම සුපිරි වාසනා ලොතරැයිය බදාදා සහ සෙනසුරාදා දිනට හඳුන්වා දෙන ලදී.

**දිනුම් අදින ලොතරැයිවල ආදායම බෙදීයාම පහත සඳහන් පරිදි වේ.**

| | මහජන සම්පත | වාසනා සම්පත | ගොවිසෙත | සුපිරි වාසනා | ජාතික සම්පත |
|---|---|---|---|---|---|
| ත්‍යාග | 49% | 47% | 47% | 47% | 47% |
| නියෝජිත කොමිස් | 17.5% | 17.5% | 17.5% | 17.5% | 17.5% |
| ඒකාබද්ධ අරමුදල | 16.5% | 16.5% | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 17% | 19% | 25.5% | 25.5% | 25.5% |

**ඒකාබද්ධ අරමුදලට දායකත්වය හා ඒකාබද්ධ අරමුදල හරහා අමාත්‍යාංශවලට දක්වන දායකත්වය පහත දක්වා ඇත.**

| | | | |
|---|---|---|---|
| මහජන සම්පත | | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| වාසනා සම්පත | | 16.5% | ඒකාබද්ධ අරමුදල |
| ගොවිසෙත | | 10% | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| සමෘද්ධි | | 10% | සමෘද්ධි හා යෞවන කටයුතු අමාත්‍යංශය |
| සුපිරි වාසනා | බදාදා දිනුම් ඇදීම | 10% | රණවිරු සේවා අධිකාරිය |
| | සෙනසුරාදා දිනුම් ඇදීම | 10% | ක්‍රීඩා අමාත්‍යාංශය හා සමාජ සේවා අමාත්‍යාංශ |
| ජාතික සම්පත | බදාදා | 10% | සෞඛ්‍ය අමාත්‍යංශය |
| | සෙනසුරාදා | 10% | කම්කරු අමාත්‍යාංශය |

මිල වෙනස් කිරීමට පෙර සෙවණ ලොතරැයියේ දල පිරිවැටුමෙන් 5 % ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති අතර මිල වෙනස් කිරීමෙන් පසුව 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.


මණ්ඩලය කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය ගුවන්තොටුපලේ හා සිවිල් ගුවන් සේවා සමාගම (ශ්‍රී ලංකා) වෙනුවෙන් පවත්වනු ලැබේ. මෙම ලොතරැයියේ ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදල හරහා, ගුවන්තොටුපල හා සිවිල් ගුවන් සේවා සමාගමට (ශ්‍රී ලංකා) ගෙවනු ලැබේ. තවද නව ගුවන් තොටුපල ඉදිකිරීමේ කටයුතු සඳහා මුදල් සම්පාදනය කිරීමේ අරමුණින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙනුවෙන් මණ්ඩලය විසින් නව ගුවන් තොටුපල ලොතරැයිය පවත්වනු ලැබීය.


# මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය






සියළුදෙනාම ජයග්‍රාහකයින්


## ග්‍රාපිත සමාලෝචනය



රු.මිලි.
පිරිවැටුම
12000
10000
8000
6000
4000
2000
0
6,079.80
6,832.50
8,580.50
8,862.80
10,092.30
2007
2008
2009
2010
2011


රු.මිලි.
ත්‍යාග සඳහා වෙන්කිරීම්
6000
4000
2000
0
2,944.90
3,373.50
4,246.50
4,295.70
4,857.90
2007
2008
2009
2010
2011


රු.මිලි.
නියෝජිත කොමිස්
2000
1500
1000
500
0
971.90
1,163.30
1,585.30
1,638.50
1874.30
2007
2008
2009
2010
2011


රු.මිලි.
රජයට කරන ලද දායකත්වය
2500
2000
1500
1000
500
0
1188.4
1326.3
1792.50
1,922.70
2,038.60
2007
2008
2009
2010
2011


රු.මිලි.
ශුද්ධ අතිරික්තය
250
200
150
100
50
0
70.6
43
45.50
31.6
209.10
2007
2008
2009
2010
2011


%
මෙහෙයුම් වියදම් දළ පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස
20
18
16
14
12
10
8
6
4
2
0
18.01
17.33
14.58
13.39
12.79
2007
2008
2009
2010
2011

## නිෂ්පාදන විෂය ධාරාව


### දිනුම් ඇදීන ලොතරැයි


### මහජන සම්පත


දිවයිනේ දැනට පවත්නා දිනුම් අදින ලොතරැයි අතරින් පැරණිතම සම්ප්‍රදායික ලොතරැයිය මහජන සම්පත වේ. පසු ගිය දශක 5 ක කාලය තුළ මෙම ලොතරැයිය මහජනතාව අතර ඉතාමත් ජනප්‍රිය ප්‍රතිරූපයක් ගොඩනගාගෙන ඇත.


2010 වාර්තා කරන ලද රු මිලියන 3,501.1 ක පිරිවැටුම හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදි වාර්තා කරන ලද රු. මිලියන 4,094.1 ක දළ පිරිවැටුම පසුගිය වසරට සාපේක්ෂව 16.9% ක වැඩිවීමක් වන අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් 16.5% ලෙස ඒකාබද්ධ අරමුදලට රු මිලියන 675.5 ක් ලබාදී ඇත.

මෙම ලොතරැයියෙන් රු මිලියන 10 ක හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු.මිලියන 2ක ප්‍රථම ත්‍යාගයක් සහිත සිත් ගන්නා සුළු ත්‍යාග රටාවක් පිරිනමනු ලැබේ.









## වාසනා සම්පත


මණ්ඩලය විසින් 1994 වසරේ මුල් කාලයේදී වාසනා සම්පත ලොතරැයිය වෙළඳපලට හඳුන්වා දෙන ලදී. සෑම බ්‍රහස්පතින්දා දිනකම මෙම ලොතරැයියේ දිනුම් ඇදීම සිදු කරන අතර මහජනතාවගේ දැන ගැනීම සඳහා රූපවාහිනිය ඔස්සේ විකාශනය කෙරේ.


2010 වාර්තා කරන ලද රු මිලියන 969.6 ක පිරිවැටුම හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී වාර්තා කරන ලද රු. මිලියන 1,080.0 ක දළ පිරිවැටුම පසුගිය වසරට සාපේක්ෂව 11.3% ක වැඩිවීමක් වන අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් 16.5% ලෙස ඒකාබද්ධ අරමුදලට රු මිලියන 178.2 ක් ලබාදී ඇත.

මෙම ලොතරැයියෙන් රු මිලියන 10 ක හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු.මිලියන 1ක ප්‍රථම ත්‍යාගයක් සහිත සිත් ගන්නා සුළු ත්‍යාග රටාවක් පිරිනමනු ලැබේ.








## ගොවිසෙත


කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය වෙනුවෙන් ගොවි භාරකාර අරමුදලට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1995 වසරේදී මණ්ඩලය විසින් ගොවිසෙත ලොතරැයිය හදුන්වා දෙන ලදී. මෙම ලොතරැයියේ දිනුම් ඇදීම සෑම සදුදා දිනකම සිදු කරන අතර මහජනතාවගේ දැන ගැනීම සදහා රූපවාහිනිය ඔස්සේ විකාශනය කෙරේ.


2010 වාර්තා කරන ලද රු මිලියන 1,148.9 ක පිරිවැටුම හා සසදන විට සමාලෝචිත වර්ෂයේදී වාර්තා කරන ලද රු. මිලියන 1,285.5 ක දළ පිරිවැටුම පසුගිය වසරට සාපේක්ෂව 11.8% ක වැඩිවීමක් වන අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් 16.5% ලෙස ඒකාබද්ධ අරමුදලට රු මිලියන 128.5 ක් ලබාදී ඇත.

මෙම ලොතරැයියෙන් රු මිලියන 10 ක හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු.මිලියන 1ක ප්‍රථම ත්‍යාගයක් සහිත සිත් ගන්නා සුළු ත්‍යාග රටාවක් පිරිනමනු ලැබේ.







## සුපිරි වාසනා සම්පත


1999 වසරේදී මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. සතියේ සෑම සෙනසුරාදා දිනකම මෙම ලොතරැයියේ දිනුම් ඇදීම සිදු කරයි.


මෙම ලොතරැයියේ සාර්ථක කාර්යසාධනය සලකා බලමින් මණ්ඩලය විසින් 2011 මාර්තු මස සිට ජයවිරු ලොතරැයිය අහෝසි කොට අලෙවිය වැඩි කිරීම සඳහා මෙය බදාදා දිනයේද දිනුම් ඇදීමට තීරනය කරන ලදී.


බදාදා දිනුම් අදින ලොතරැයියේ දායකත්වය රණවිරු සේවා අධිකාරියට ද සෙනසුරාදා දිනුම් අදින ලොතරැයියේ දායකත්වය ක්‍රීඩා අමාත්‍යාංශයට හා සමාජ සේවා අමාත්‍යාංශයට සමව බෙදා දේ.


2010 වාර්තා කරන ලද රු මිලියන 930.4 ක පිරිවැටුම හා සසදන විට සමාලෝචිත වර්ෂයේදී වාර්තා කරන ලද රු. මිලියන 1,820.8 ක දළ පිරිවැටුම පසුගිය වසරට සාපේක්ෂව 95.7% ක වැඩිවීමක් වන අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් 10% ලෙස ඒකාබද්ධ අරමුදලට රු මිලියන 182.0 ක් ලබාදී ඇත.

මෙම ලොතරැයියෙන් රු මිලියන 10 ක හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු.මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහිත සිත් ගන්නා සුළු ත්‍යාග රටාවක් පිරිනමනු ලැබේ.






## ජයවිරු

ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් රණවිරු සේවා අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 2000 වසරේ මණ්ඩලය විසින් හදුන්වා දෙන ලද මෙම ජයවිරු ලොතරැයියේ දිනුම් ඇදීම සෑම බදාදා දිනකම සිදු කරන ලද අත 2011 මාර්තු මස සිට මෙම ලොතරැයිය වෙනුවට සුපිරිවාසනා ලොතරැයිය හදුන්වා දෙන ලදී.

සමාලෝචිත වසරේදී රු. මිලියන 153.4 ක (මාස තුනක කාලපරිච්ඡේදය සදහා) පිරිවැටුමක් වාර්තා කරන ලද අත පිරිවැටුමෙන් 10% ලෙස ඒකාබද්ධ අරමුදලට රු මිලියන 15.3 ක් ලබාදී ඇත.

## ජාතික සම්පත

2010 වසරේ මාර්තු මස මණ්ඩලය විසින් සුවසෙත හා ශ්‍රම වාසනා ලොතරැයි වෙනුවට මෙම ලොතරැයිය හදුන්වා දෙන ලද අතර සෞඛ්‍ය හා කම්කරු අමාත්‍යාංශය වෙනුවෙන් බදාදා හා සෙනසුරාදා යන දිනවල දිනුම් අදියි.

2010 (මාස නවයක කාලපරිච්ඡේදය සදහා )වාර්තා කරන ලද රු මිලියන 492.7ක පිරිවැටුම හා සසදන විට සමාලෝචිත වර්ෂයේදී  රු. මිලියන 786.4 ක දළ පිරිවැටුමක් උපයාගත් අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් 10% ලෙස ඒකාබද්ධ අරමුදලට රු මිලියන 78.6 ක් ලබාදී ඇත.

මෙම ලොතරැයියෙන් රු මිලියන 5 ක හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු.මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහිත සිත් ගන්නා සුළු ත්‍යාග රටාවක් පිරිනමනු ලැබේ.




## ක්ෂණික ලොතරැයි


### සෙවණ


නිවාස ඉදිකිරීම සඳහා අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1985 වසරේදී ආරම්භ කරන ලදී. ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගත් ජනප්‍රිය ක්ෂණික ලොතරැයියකි.


සෙවණ ලොතරැයිය වෙනම ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර පසුව 1997 වසර අවසානයේදී ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ ඒකාබද්ධ කරන ලදී.මෙම ලොතරැයියේ මිල 2008 වසරේ සැප්තැම්බර් මස 02 දින රු.10/- සිට රු.20/- දක්වා වැඩිකරන ලදී.

2010 වාර්තා කරන ලද රු මිලියන 753.8 ක පිරිවැටුම හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී වාර්තා කරන ලද රු. මිලියන 771.0ක දළ පිරිවැටුම පසුගිය වසරට සාපේක්ෂව 2.2% ක වැඩිවීමක් වන අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් 10% ලෙස ඒකාබද්ධ අරමුදලට රු. මිලියන 77.1 ක් ලබාදී ඇත.






## සමෘද්ධි

සමෘද්ධි අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1996 වසරේදී සමෘද්ධි ලොතරැයිය ආරම්භ කරන ලදී. මෙය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපලට හඳුන්වා දුන් පළමු ක්ෂණික ලොතරැයිය වේ. දිනුම් ලාභින් නිශ්චය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගෙන ඇත.

මෙම ලොතරැයියේ මිල 2008 වසරේ සැප්තැම්බර් මස 02 දින රු.10/- සිට රු.20/- දක්වා වැඩිකරන ලදී.

2010 වාර්තා කරන ලද රු මිලියන 96.5 ක පිරිවැටුම හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 95.6ක දළ පිරිවැටුමක් වාර්තා කරන ලද අතර මෙම ලොතරැයියේ පිරිවැටුමෙන් ඒකාබද්ධ අරමුදලට රු මිලියන 9.5ක් ලබාදී ඇත.



## නව ගුවන්තොටුපල ලොතරැයිය

එක් ටිකට්පතක මිල ඇමෙරිකානු ඩොලර් 10 ක් වන අතර ටිකට්පත් 10,000 තිබිනි. මෙම ලොතරැයියේ ටිකට්පත් අලෙවිවන්නේ ඉතා සෙමින් බැවින් 2011 වසරේදි දිනුම් ඇදීම පවත්වා නවතා දමන ලදි.


TATA indigo වර්ගයේ මෝටර් රථ දෙකක් හා එකක් රු.150,000/ වටිනා ප්ලස්මා වර්ගයේ රූපවාහිනි 3 ක් පිරිනමන ලදී.

## එයාර්පෝට් සුපර් ඩ්‍රෝ

සිවිල් ගුවන් සේවා අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 1992 වසරේ එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය හදුන්වා දෙන ලදී. වර්තමානයේ එම ටිකට්පත ඇමෙරිකානු ඩොලර් 50 කට හෝ ඊට සමාන පරිවර්තිත මුදල්වලට අලෙවි කරනු ලැබේ.

ත්‍යාගය වන්නේ තීරු බදු රහිත මිළ රක්ෂණ නැව් ගාස්තු ආදායමෙන් 47% නොඉක්මවූ සුඛෝපභෝගී මෝටර් රථයකි. දිනුම් ඇදීමට අදාල නියමිත ටිකට්පත් ප්‍රමාණය (වර්තමානයේදි ටිකට්පත් 6,000) විකිණී අවසන් වීමෙන් පසු දිනුම් ඇදීම සිදු කරනු ලැබේ.

මෙම ලොතරැයියේ සුපිරි අති සුඛෝපභෝගි (Benz හෝ BMW) මෝටර්රථයක් පිරිනමනු ලැබේ.



## පසුගිය දශකයේ සාරාංශය

| | 2002 | 2003 | 2004 | 2005 |
|---|---|---|---|---|
| **දළ පිරිවැටුම** | **4,965,365,543** | **7,181,894,656** | **6,489,740,091** | **6,166,897,652** |
| අඩුකළා : නියෝජිත කොමිස් | 742,133,045 | 1,074,594,281 | 968,625,493 | 968,319,771 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 2,343,684,869 | 3,398,836,469 | 3,064,898,835 | 2,952,266,317 |
| | 3,085,817,914 | 4,473,430,750 | 4,033,524,328 | 3,920,586,088 |
| **මණ්ඩලීය ආදායම්** | **1,879,547,629** | **2,708,463,906** | **2,456,215,763** | **2,246,311,564** |
| එකතු කළා: වෙනත් ආදායම් | 249,968,432 | 210,700,436 | 136,869,969 | 114,548,796 |
| | 2,129,516,061 | 2,919,164,342 | 2,593,085,732 | 2,360,860,360 |
| අඩුකළා මෙහෙයුම් වියදම් | 849,428,724 | 1,196,217,189 | 1,087,609,868 | 843,175,632 |
| **මණ්ඩලීය දළ අතිරික්තය** | **1,280,087,337** | **1,722,947,153** | **1,505,475,864** | **1,517,684,728** |
| අඩුකළා: රජයට දායකත්වය | | | | |
| ඒකාබද්ධ අරමුදල | 804,380,769 | 1,122,925,499 | 957,999,258 | 957,406,531 |
| බදු ප්‍රතිපාදන | - | 327,081,509 | 315,474,997 | 402,132,646 |
| වෙනත් දායකත්වයන් | - | 114,250,000 | 127,962,730 | - |
| | 804,380,769 | 1,564,257,008 | 1,401,436,985 | 1,359,539,177 |
| අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය | 475,706,568 | 158,690,145 | 104,038,879 | 158,145,551 |
| අඩුකළා: අති විශේෂ අයිතමයන් | 101,075,561 | - | - | - |
| **මණ්ඩලීය ශුද්ධ අතිරික්තය** | **374,631,007** | **158,690,145** | **104,038,879** | **158,145,551** |
| රජයට දක්වන ලද දායකත්වය පිරිවැටුමේ % ලෙස | 16.20% | 21.78% | 21.60% | 22.05% |
| රජයට දක්වන ලද දායකත්වය මණ්ඩලීය දළ අතිරික්තයේ % ලෙස | 62.84% | 90.79% | 93.09% | 89.58% |
| මණ්ඩලීය ශුද්ධ අතිරික්තය දළ පිරිවැටුමේ % ලෙස | 7.54% | 2.21% | 1.61% | 2.57% |
| මෙහෙයුම් වියදම් දළ පිරිවැටුමේ % ලෙස | 17.11% | 16.66% | 16.76% | 13.68% |
| **පිරිවැටුමේ වර්ධන වේගය %** | 28.39% | 44.64% | (.10.67%) | (.4.98%) |


* අමාත්‍යාංශය විසින් භාරකාර අරමුදල හරහා අඩුකර ගන්නා ලද රු.මිලියන 146.5, 2010 වසරේ රජයට දක්වන ලද දායකත්වය තුල ඇතුලත් කර නැත.

සංඛ්‍යා රු.වලින්

| 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| **6,460,015,752** | **6,079,850,149** | **6,832,519,239** | **8,580,538,712** | **8,862,869,826** | **10,092,330,623** |
| 1,025,881,243 | 971,932,383 | 1,163,307,511 | 1,585,329,388 | 1,638,501,705 | 1,874,354,373 |
| 3,115,594,961 | 2,944,926,273 | 3,373,592,920 | 4,246,564,845 | 4,295,786,207 | 4,857,951,333 |
| 4,141,476,204 | 3,916,858,656 | 4,536,900,431 | 5,831,894,233 | 5,934,287,912 | 6,732,305,706 |
| **2,318,539,548** | **2,162,991,493** | **2,295,618,808** | **2,748,644,479** | **2,928,581,914** | **3,360,024,917** |
| 136,114,584 | 191,205,560 | 257,996,742 | 340,680,571 | 212,424,233 | 178,866,138 |
| 2,454,654,132 | 2,354,197,053 | 2,553,615,550 | 3,089,325,050 | 3,141,006,147 | 3,538,891,055 |
| 1,052,703,195 | 1,095,113,324 | 1,184,190,534 | 1,251,296,219 | 1,186,623,778 | 1,290,934,224 |
| **1,401,950,937** | **1,259,083,729** | **1,369,425,016** | **1,838,028,831** | **1,954,382,369** | **2,247,956,831** |
| 845,908,023 | 767,590,790 | 898,282,571 | 1,136,298,465 | 1,173,460,051 | 1,345,046,907 |
| 466,703,676 | 420,814,224 | 428,100,646 | 656,217,994 | 733,284,428 | 693,805,894 |
| - | - | - | - | 16,000,000 | - |
| 1,312,611,699 | 1,188,405,014 | 1,326,383,217 | 1,792,516,459 | 1,922,744,479* | 2,038,852,801 |
| 89,339,238 | - | 43,041,800 | 45,512,372 | 31,637,890 | 209,104,030 |
| 31,024,922 | 70,678,715 | - | - | - | - |
| **58,314,316** | **70,678,715** | **43,041,800** | **45,512,372** | **31,637,890** | **209,104,030** |
| 20.32% | 19.55% | 19.41% | 20.89% | 21.69% | 20.20% |
| 93.63% | 94.39% | 96.86% | 97.52% | 98.38% | 90.70% |
| 0.90% | 1.16% | 0.63% | 0.53% | 0.36% | 2.07% |
| 16.30% | 18.01% | 17.33% | 14.58% | 13.39% | 12.79% |
| 4.75% | (.5.88)% | 12.37% | 25.58% | 3.29% | 13.87% |

## සාමූහික සමාජීය වගකීම්

කලා, සංස්කෘතික, ක්‍රීඩා හා සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙමින්




මහනුවර පෙරහැර




කැළණි පෙරහැර



කතරගම පෙරහැර



සුමති ටෙලි සම්මාන උළෙල - 2011




කාල්ටන් සුපර්ක්‍රොස් - 2011





දැයට කිරුළ ප්‍රදර්ශනය - 2011



මාධ්‍ය සාකච්ඡාව

සසකාවා ශාලාව - කොල්ලුපිටිය



දිස්ත්‍රික් නියෝජිත සම්මන්ත්‍රණය

සී ව්ව් හෝටලය - කොල්ලුපිටිය





බැංකොක් සංචාරයක් සඳහා ලොතරැයි වරම් දිනු වාසනා සම්පත විශේෂ ලොතරැයියේ ත්‍යාගලාභින් සඳහා චෙක්පත් ප්‍රදානය කිරීම



සේවක අභිප්‍රේරණ වැඩමුළුව - ගලධාරි හෝටලය




5 එස් වැඩසටහන ක්‍රියාත්මක කරමින්



අලෙවි නියෝජිතයින් සඳහා වැඩුමුළු පැවැත්වීම



ලොතරැයි ඉතිහාසයේ මෙතෙක් දිනාගත් ඉහළම ත්‍යාගය (රු.මිලියන 61.3) දිනාගත් ත්‍යාගලාභියාට අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සුරතින් ත්‍යාගය පිරිනැමු මොහොත



සසකාවා හෝටලයේදී සුපිරි ත්‍යාගලාභින් සඳහා චෙක්පත් ප්‍රදානය කිරීම.

විගණකාධිපති වාර්තාව
ඊ එෆ්/ඒ/එන් එල් බී/11
සභාපති
ජාතික ලොතරැයි මණ්ඩලය

2012 ජූනි 19 දින

## ජාතික ලොතරැයි මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1963 අංක 11 දරණ මුදල් පනතේ 11 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක්

පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 1,820,507 ක් වටිනා ඉදිරියේදී දිනුම් ඇදීමට නියමිත ලොතරැයිපත් 3,474,920 ක් මණ්ඩලයේ ගබඩාව වෙත අදාල සැපයුම්කරුවන් විසින් බාරදී තිබුණ ද එම සැපයුම් වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවිය යුතු බැරකම් මෙන්ම තොග පිරිවැයද ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ)** මණ්ඩලය ටිකට්පත් මුද්‍රණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 376,528,826 ක් හා ඉකුත් වර්ෂයේදී රු.293,504,383 ක් වැය කර තිබුණ අතර, මෙම වියදම් සෘජු වියදම් ලෙස ගිණුම්වල හෙළිදරව් කල යුතු නමුත් වෙනත් වියදම් ලෙස අනුචිතව හෙළිදරව් කර තිබුණි.

### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ජාතික ලොතරැයි මණ්ඩලයට අනුබද්ධ සෙවණ ලොතරැයිය මගින් 1993 සිට 1996 වසර දක්වා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත ලබා දී තිබූ රු. 89,601,618 /- ක ණය මුදල් සහ ඒ වෙනුවෙන් ලැබිය යුතු රු. 96,075,562 ක් වූ පොලිය සමාලෝචිත වර්ෂය දක්වාම අයකර ගෙන නොතිබුණි.

**(ආ)** සෙවණ ලොතරැයි නියෝජිතයන්ගෙන් මණ්ඩලය වෙත 1996 වර්ෂයේ සිට අයවිය යුතුව තිබූ රු. 1,405,968 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම අයකරගෙන නොතිබුණි.

**(ඇ)** 2003 වසරේ සිට දිස්ත්‍රික් අලෙවි නියෝජිතයන් වෙත ගෙවිය යුතුව තිබූ රු. 1,314,430 ක සේවා ගාස්තු බේරුම් කිරීමට පියවර නොගෙන රඳවා ගැනීම් ලෙස ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් සම්බන්ධව ඊට ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| **(අ)** සංචාරක බංගලා වැඩි දියුණු කිරීම | 7,403,596 | මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය |
| **(ආ)** ත්‍යාග ප්‍රදානය සඳහා මිලටගෙන තිබූ ස්වර්ණාභරණ | 2,266,430 | i. අඩංගු රන් බර පිළිබඳ වාර්තා<br>ii. පිලිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලද තොග සත්‍යතාසීක්ෂණ වාර්තා |

### 2.2.4 නීති,රීති. රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 අංක 35 දරන මුදල් පනත මගින් සංශෝධිත 1963 අංක 11 දරන මුදල් පනතේ 20 වගන්තිය | 2008 අගෝස්තු 22 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කරන ලද කෙටුම්පත් රීතිවලට අනුකූලව අරමුදල් වෙන් කිරීම හා තැගි ව්‍යුහගත කිරීම සිදුකර වාර්තාවේ දිනය දක්වාම ගැසට් පත්‍රයේ පළකර නොතිබුණි. |
| (ආ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 6 (2) (අ) වගන්තිය | පාරිතෝෂික ගෙවීම් පනත අනුව නිලධාරීන් සඳහා පාරිතෝෂික වශයෙන් අවසාන වරට ලැබූ වැටුපෙන් මාස 1/2 ක වැටුප වෙන් කල යුතු වුවත් ඊට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව මසක වැටුප වශයෙන් රු.65,695,595 ක වෙන් කිරීම් සිදු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල විශ්‍රාම ගිය නිලධාරීන් සඳහා රු.12,126,300 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. අංක 502 වැනි මුදල් රෙගුලාසියේ 11 වැනි පරිශිෂ්ඨයේ 3 වැනි උපලේඛනය | පොත් අගය රු. 388,203,362 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. සත්‍යාපනය කරන ලද වත්කම් ස්ථාවර වත්කම් ශේෂයට ගලපා නොතිබුණු අතර ඒ අනුව නැතිවීම්, අස්ථානගතවීම් නිසා සිදුවන පාඩු මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණි. |
| ii. අංක 685 වැනි මුදල් රෙගුලාසිය හා 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරණ ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛය | මණ්ඩලය ටිකට් මුද්‍රණය සඳහා මුළු මෙහෙයුම් වියදම්වලින් 29% ප්‍රතිශතයක් වැයකර තිබුණ අතර ඉන් 20.7%ක්ම පෞද්ගලික ආයතනවලින් ඉටුකරවාගෙන තිබුණු මුද්‍රන කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. නමුත් මෙම වියදම් සඳහා ටෙන්ඩර් පරිපාටි අනුගමනය කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මුද්‍රණ වියදම් වලින් රු. 267,387,445 ක් ටෙන්ඩර් කැඳවීමකින් තොරව සිදුකර තිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br><br>9 පරිච්ඡේදයේ 7 ඡේදය | i. සහකාර සාමාන්‍යාධිකාරී අලෙවි, බෙදාහැරීම් සහ නියෝජිත කළමනාකරණ තනතුරු සඳහා බඳවාගෙන තිබූ නිලධාරීන් තිදෙනෙකුට හිමි රු. 25,640/න වැටුප 2011 ජුනි මස 20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් 2011 ජනවාරි 03 දින සිට රු. 45,000 දක්වා වැඩිකර තිබුණ නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br><br>(ii) කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබූ රු. 7,771,220 ක් වූ ප්‍රවාහන දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ජේදය | වැඩ හා සේවාවන් සඳහා ලබාදිය හැකි උපරිම කාර්ය පූර්ව අත්තිකාරම් මුදල කොන්ත්‍රාත් මුදලින් 20% ක් වුවත් ඊට පටහැනිව 50% සිට 75% දක්වා රු.39,939,818 ක අත්තිකාරම් සැපයුම්කරුවන් වෙත ගෙවා තිබුණි. |
| (ඊ) 2008 දෙසැම්බර් 31 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 142 | සංස්ථා හා මණ්ඩල සේවකයන් සඳහා ලබාදිය හැකි උත්සව අත්තිකාරම් මුදල රු.5000ක් වුවත් උත්සව අත්තිකාරම් ලෙස මාසික වැටුප ගෙවීම නිසා රු. 3,220,095 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (උ) 2009 ජුනි 01 දිනැති කළමනාකාරණ චක්‍රලේඛ අංක 34 (1) | සංස්ථා හා මණ්ඩල සේවකයන් සඳහා නිර්දේශ කර ඇති සංයුක්ත දීමනා රේට් ගණන්වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත අනුමත කරගත් විවිධ රේට් ගණන් මත සංයුක්ත දීමනා රු8,311,843 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. මිලියන 209 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 32 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 177 ක හෙවත් 553.12% ක වර්ධනයක් දැක්විණි.

එම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය පිළිබඳව විග්‍රහයක් පහතින් දැක්වේ.

### විචලනය

| | වාසිදායක රු. මිලියන | අවාසිදායක රු. මිලියන | රු.මිලියන |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ලොතරැයි විකුණුම් ආදායම | 1,229 | - | |
| වෙනත් ආදායම් | - | 33 | |
| | 1,229 | 33 | 1,196 |
| **වියදම්** | | | |
| නියෝජිත කොමිස් | - | 235 | |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | - | 172 | |
| ත්‍යාග ප්‍රදානය කිරීම් | - | 562 | |
| පරිපාලන වියදම් | - | 10 | |
| බෙදාහැරීමේ වියදම් | - | 04 | |
| මූල්‍ය වියදම් | 04 | - | |
| වෙනත් වියදම් | - | 95 | |
| අගය එකතු කිරීමේ බදු | - | 49 | |
| ජාතිය ගොඩනැගීමේ බදු | 44 | - | |
| ආදායම් බදු | 44 | - | |
| භාණ්ඩාගාරයට විශේෂ ප්‍රදාන | 16 | - | |
| | 108 | 1,127 | 1,019 |
| | | | 177 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මණ්ඩලය සඳහා මන්නාරම මුරුක්කන් ප්‍රදේශයේ රු. මිලියන 50 ක වියදමින් සංචාරක බංගලාවක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබූ අතර, ගිවිසුම් ප්‍රකාර ඉදිකිරීම් කටයුතු 2011 මැයි මස 05 දිනෙන් ආරම්භ වී දින 180 කින් එනම් 2011 නොවැම්බර් මස 05 දින නිම කළ යුතු වුවත් 2012 මාර්තු 31 වන විටත් අදාල ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

**(ආ)** මණ්ඩලය 1986 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බදු පදනම මත ලබාගෙන තිබූ අනුරාධපුර ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක සංචාරක බංගලාවක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා 2011 නොවැම්බර් 01 දින රු. 7,403,596 කට පෞද්ගලික සමාගමකට බාර දී තිබුණ අතර ගිවිසුම් ගත දිනයට ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. ඉදිකිරීම අධීක්ෂණය සඳහා පත්කර තිබූ ආයතනයට රු. 505,253 ක් ගෙවා තිබුණද ඔවුන් විසින් සිදුකරන ලද අධීක්ෂණ කටයුතු පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොකෙරුණි. තවද, බදු කාලසීමාව අවුරුදු 4 ක් පමණක් ඉතිරිව තිබියදී මෙවැනි අලුත්වැඩියාවක් සිදුකිරීම ආර්ථික වශයෙන් යෝග්‍ය වන්නේද යන්න විගණනයේදී ගැටළු සහගත විය.

**(ඇ)** මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2010 ජුලි 21 දින රු. මිලියන 300 ක් ගෙවා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩමක් මිලදී ගෙන එම ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 619 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉදිකිරීම් ආරම්භ නොකර කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ලක ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම වෙනුවෙන් රු. මිලියන 13.58 ක බදු කුලී බාහිර පාර්ශවයක් වෙත ගෙවීමට සිදු වී තිබුණි.

**(ඈ)** අලෙවි ප්‍රවර්ධන වැය ශීර්ෂය යටතේ පූර්ව සැලසුම් කිරීමකින් තොරව රු. 4,000,000 ක වියදම් දරා තිබුණි.

### 4.2 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** ලොතරැයි ත්‍යාග පිරිනැමීම සඳහා 1996 වර්ෂයේ සිට මණ්ඩලය පවුමක් රු. 8,668 බැගින් මිලට ගෙන තිබූ පවුම් 16 ක, පවුමක් 4,860 බැගින් මිලට ගෙන තිබූ පවුම් 2 ක හා පවුමක් 9,299 බැගින් මිලට ගෙන තිබූ පවුම් 57 ක එකතු වටිනාකම වූ රු. 678,451 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ත්‍යාග ප්‍රදානය සඳහා යොදා ගැනීමකින් තොරව ගබඩාවල තිබූ අතර එම රන් භාණ්ඩවල වර්තමාන වටිනාකම රු. 1,185,000 ක්ව තිබුණි.

**(ආ)** ත්‍යාග ලෙස බෙදාහැරීම සඳහා 2009 වර්ෂයේ මිලදී ගෙන තිබූ එකතුව රු. 1,104,536 ක් වූ මෝටර් බයිසිකල් 5 ක් හා ත්‍රී රෝද රථ 2 ක් සමාලෝචිත වර්ෂය දක්වාම බෙදා හැර නොතිබුණු අතර එම රථ මණ්ඩලය සතු වාහන අංගනයේ අනාරක්ෂිතව ගාල් කොට තිබුණි.

**(ඇ)** සෙවණ ලොතරැයි ප්‍රචාරණ කටයුතු සඳහා මිලට ගෙන තිබූ එකතුව රු. 536,470 ක් වූ පිත්තල ලාම්පු , බයිසිකල්, රූපවාහිනී, මහන මැෂින්, තේ කට්ටල, ටී ෂර්ට් සහ කුඩ යනාදී තොග අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර එම තොග ත්‍යාග සඳහා බෙදාහැරීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා හෝ යොදාගෙන නොතිබුණි.

### 4.3 හඳුනාගත් පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මණ්ඩලය, ඉන්දියානු සමාගමකින් ආනයනය කර තිබුණ ක්ෂණික ලොතරැයිපත් වරායට ලැබුණු පසු දින 07 ක් ඇතුලත නිෂ්කාශනය කර නොගැනීම නිසා රු. 357,291 ක නිෂ්කාශන අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂය තුල සෙවණ ක්ෂණික ලොතරැයිපත් 6,700 ක් හා සමෘද්ධි ක්ෂණික ලොතරැයිපත් 32,900 ක්, වතුරෙන් විනාශවීම නිසා මණ්ඩලයට රු. 67, 914 ක පාඩුවක් සිදුවී තිබුණි.

**(ඇ)** 2008 දෙසැම්බර් මස 17 දිනැති අංක එම්එෆ්/2/2/ඩීඑල්බී/ටීර්එන්ඩී/02 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාර දේශීය සැපයුම්කරුවන්ගෙන් ලොතරැයිපත් මුද්‍රණය කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුල පමණක් මණ්ඩලයට රු. 47,101,200 ක සෙස් බදු හා රු. 22,703,677 ක ආනයන තීරු බදු මුදලක් නිෂ්කාර්යව වැය කිරීමට සිදු වී තිබුණි.

**(ඈ)** මණ්ඩලය 2002 ජුනි 12 දින ප්‍රමුඛ බැංකුවේ ආයෝජනය කරන ලද රු. 5,000,000 ක ආයෝජන හා

එම ආයෝජන වෙනුවෙන් ලැබිය යුතු පොලී ආදායමද මණ්ඩලයට අහිමි වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් එකී ආයෝජන මුදලට සමාන අඩමාණ ණය ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

### 4.4 මානව සම්පත් කළමණාකරනය

අනුමත කාර්ය මණ්ඩලය 281 ක් පමණ වුවද මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලය 304 ක් සේවයේ යොදවා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු හා අතිරික්තතා තත්ත්වය පහත වගුවෙන් දැක්වේ.

| සේවක වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විධායක ශ්‍රේණිය | 25 | 24 | 01 | - |
| විධායක නොවන ශ්‍රේණි | 256 | 242 | 14 | - |
| කොන්ත්‍රාත් පදනම | - | 38 | - | 38 |
| එකතුව | 281 | 304 | 15 | 38 |

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්‍ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂනය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) මානව සම්පත් කළමනාකරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) වියදම් කළමනාකරණය

(ඈ) තොග

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති